# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 59 දරන ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත

---

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 15 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 දෙසැම්බර් මස 18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 13.50 තැපැල් ගාස්තුව : රු. 5.25

# 1998 අංක 59 දරන ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත

[සහතිකය සටහන් කළේ 1998 දෙසැම්බර් මස 15 වන දින.]

එල්.ඩී.—ඕ. 55/95.

**ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයක් පිහිටුවීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.**

**1.** මේ පනත 1998 අංක 59 දරන ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## 1 වන කොටස

## ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පිහිටුවීම

**ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය පිහිටුවීම.**

**2.** (1) (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය යනුවෙන් හඳුන්වනු ලබන ආයතනයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) ආයතනය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ආයතනය විසින් නඩු පැවරීම ද, ආයතනයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද, කරනු ලැබිය හැකි ය.

**ආයතනයේ කර්තව්‍ය.**

**3.** ආයතනයේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය :—

(අ) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන සියලු වැඩ පිළිවෙල, සේවා හා ව්‍යාපෘති පවත්වාගෙන යාම ;

(ආ) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනත මගින් පිහිටුවන ලද තෘතීයික අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් පිළියෙල කරන ලද සංවර්ධන සැලැස්මට හෝ සැලසුම්වලට

2—D 049800—5,900 (98/08)

අනුකූලව කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයේ මානව සම්පත් සංවර්ධනයට හා විෂයමාලා සංවර්ධනයට අදාළ ප්‍රතිපත්තිය සකස් කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ එකී කොමිෂන් සභාවට උපදෙස් දීම හා සහාය වීම ;

(ඇ) කොමිෂන් සභාව විසින් පිළියෙල කරන ලද සංවර්ධන සැලසුමට හෝ සැලසුම්වලට අනුකූලව, ශ්‍රී ලංකාවෙහි මානව සම්පත් සංවර්ධනය, විෂයමාලා සංවර්ධනය හා පර්යේෂණවලට අදාළ සැලසුම්, වැඩ පිළිවෙල හා කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යවරයාට උපදෙස් දීම සහ කොමිෂන් සභාවට උපදෙස් දීම හා සහාය වීම ;

(ඈ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ වැඩ පිළිවෙල හා සේවා සලසන ආයතන මගින් කාර්මික හා වෘත්තීය පුහුණුවීම් ප්‍රමිති, කොමිෂන් සභාව වෙනුවෙන් හා එහි ඉල්ලීම පරිදි, පරීක්ෂා කිරීම ;

(ඉ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය සම්බන්ධයෙන් වූ පුහුණුවීමේ වැඩ පිළිවෙල හා සේවා සැලසීම ;

(ඊ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, ගුරු විභාග හා ප්‍රතීතනය සඳහා වූ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම ;

(උ) පුහුණු කිරීමේ කාර්ය සඳහා උචිත තාක්ෂණය යොදා ගැනීම ඇතුළුව, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයෙහි ලා ගුරුවරුන් පුහුණු කිරීමේ ශිල්පය හා සම්බන්ධ පිළිවෙත් ආරම්භ කොට ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ඌ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව, මානව සම්පත් සංවර්ධනයේ, විෂයමාලා සංවර්ධනයේ ඉගැන්වීමේ ක්‍රමවේදය, ඉගැන්වීමේ තාක්ෂණය, අධ්‍යාපනික තාක්ෂණය, වෘත්තීය මාර්ගෝපදේශකත්වය හා උපදේශනය යන්නෙහි විවිධ කාර්ය බද්ධ ක්ෂේත්‍රයන්හි වෘත්තීය සේවා සැලසීම ;

(එ) උපාධි තත්ත්වයේ හා පශ්චාත් උපාධි තත්ත්වයේ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණුව සැලසීම හා ප්‍රවර්ධනය කිරීම ;

(ඊ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයෙහි කාර්ය ඉටු කිරීම, කර්මාන්තයේ අවශ්‍යතා, ආයතන වැඩ පිළිවෙලවල්, ගුරු පුහුණු අවශ්‍යතා සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව හා සම්බන්ධ සමාජ, ආර්ථික හා වෙනත් අංශ ඇතුළු, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයෙහි සියලු අංශ පිළිබඳ පර්යේෂණ හා වෙනත් අධ්‍යයන භාරගෙන ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) අවශ්‍ය වන අවස්ථාවක, ජාතික හා ජාත්‍යන්තර සංවිධානවල සහාය ඇතිව, කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයේ හා පුහුණුවේ සියලු අංශ සම්බන්ධයෙන් සම්මේලන, සම්මන්ත්‍රණ සහ වැඩමුළු සඳහා අනුග්‍රහය දක්වා ඒවා පැවැත්වීම සහ පොත්පත්, වාර සඟරා හා සඟරා පළ කිරීම ; සහ

(ඕ) ආයතනයේ කර්තව්‍ය හා සමාන කර්තව්‍ය ඉටු කරන ශ්‍රී ලංකාවේ හා විදේශ රටක පිහිටා ඇති වෙනත් ආයතන සමග සම්බන්ධව කටයුතු කිරීම හා ඒ ආයතන හා සම්බන්ධීකරණය වීම.

4. මේ පනතේ විධිවිධානවලට යටත්ව, ආයතනයට පහත සඳහන් බලතල ඇත්තේ ය :— ආයතනයේ බලතල.

(අ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපන සංවර්ධනයේ සහ කාර්මික පුහුණු කරවන්නන් පුහුණු කිරීමේ යම් අංශයකට අදාළව පර්යේෂණ, සමීක්ෂණ හා විමර්ශන ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පවත්වාගෙන යාම හා ඒවා සම්බන්ධීකරණය කිරීම ;

(ආ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපනය හා පුහුණු කිරීමේ ක්ෂේත්‍රයේ පුහුණු කරවන්නන් වශයෙන් සුදුසුකම් ලැබීමට කැමති තැනැත්තන්ට, විවිධ ඉගැන්වීමේ මාධ්‍ය තුළින් අධ්‍යාපන හා පුහුණුකිරීමේ වැඩ පිළිවෙලවල් හා පාඨමාලා පවත්වා, ඒ වැඩ පිළිවෙලවල් හා පාඨමාලා සාර්ථක ලෙස අවසන් කර නියමිත විභාග සමත් වී ඇති තැනැත්තන්ට සහතික, අභිඥාන පත්‍ර, ආශ්‍රිත උපාධි හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා පිරිනැමීම ;

(ඇ) ආයතනයේ කාර්ය සඳහා, පුස්තකාල, වැඩපොළවල් හා රසායනාගාර සඳහා උපකරණ සැපයීම සහ ඒ පුස්තකාල, වැඩපොළවල්, රසායනාගාර හා වෙනත් පහසුකම් පවත්වාගෙන යාම සහ කාර්මික හා වෘත්තීය අධ්‍යාපන පුහුණු කිරීමේ ක්ෂේත්‍රයෙහි පුහුණු කරවන්නන් පුහුණු කිරීම පිණිස අවශ්‍ය වන වෙනත් සේවා සැලසීම ;

(ඈ) කාර්මික හා වෘත්තීය අධ්‍යාපනයෙහි හා ආයතනයේ වෙනත් කටයුතුවල දී කාර්මික හා වෘත්තීය පුහුණු කරන්නන්ගේ අධ්‍යාපන හා පුහුණු කිරීමේ වැඩසටහන් සහ පාඨමාලා පවත්වාගෙන යාමේ කාර්යය සඳහා ප්‍රාදේශීය මධ්‍යස්ථාන පිහිටුවීම සහ ඒවා පවත්වාගෙන යාම ;

(ඉ) ආයතනයේ කර්තව්‍ය හා කාර්ය ඉටු කිරීම පිණිස ආයතනයට උපදෙස් දීමේ හා සහාය වීමේ කාර්ය සඳහා 1995 අංක 12 දරන ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) වෘත්තීය පුහුණු සභා උපයෝගී කර ගැනීම සහ ඒ සභාවල කටයුතු සඳහා පහසුකම් සැලසීම හා ඒ කටයුතු සම්බන්ධීකරණය කිරීම ;

(ඊ) තොරතුරු, පිරිස් හා ශිෂ්‍යයන් හුවමාරු කර ගැනීම සඳහා ද, සමාන්‍යයෙන් ආයතනයේ කර්තව්‍ය ඉටු කර ගැනීමෙහි ලා හිතකර විය හැකි යම් කාර්ය සඳහා ද, ආයතනය විසින් ඉටු කරනු ලබන කර්තව්‍යවලට සමාන කර්තව්‍ය ඉටු කරන, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය රටක ඇති අධ්‍යාපන හෝ වෙනත් ආයතන සමග ගිවිසුම්වලට ඇතුළත් වීම ;

(උ) ආයතනය විසින් සලසනු ලබන සේවා සඳහා හෝ සපයනු ලබන පහසුකම් හෝ උපකරණ සඳහා ගාස්තු හෝ වෙනත් අයකිරීම් පනවා, අයකර ගැනීම ;

(ඌ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම හෝ කුලියට ගැනීම, ඔඩපනය කිරීම හෝ විකිණීම නැතහොත් අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(එ) ආයතනයේ පුහුණුලාභීන්, නිලධරයන් සහ සේවකයන් සඳහා මූලාධාර, ශුභසාධන හා විනෝද ක්‍රීඩා පහසුකම්, නිවාස සහ වෙනත් නවාතැන් සැපයීම ;

(ඒ) ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට හා එකඟවීම්වලට කෙළින් ම හෝ ආයතනය විසින් තත් කාර්ය සඳහා බලය දෙනු ලැබූ යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු මගින් ඇතුළුව ඒ ගිවිසුම් හා එකඟවීම් ක්‍රියාවෙහි යෙදවීම ;

(ඔ) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් සහ එහි නිලධරයන් හා සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන්ගේ විනය පාලනය, සේවයෙන් පහකිරීම සහ ඔවුන්ට නිවාඩු දීම ඇතුළුව, ඒ නිලධරයන්ට හා සේවකයන්ට අදාළව රීති සෑදීම ;

(ඕ) ආයතනය විසින් පුහුණු කිරීම සඳහා තෝරාගනු ලැබූ පුහුණු ලාභීන්ට ගෘහස්ථ පුහුණුව සැපයීම සඳහා සේවා යෝජකයන් සමග ගිවිසුම්වලට එළඹීම ; සහ

(ක) ආයතනයේ මතය අනුව ආයතනයේ අරමුණු මුදුන්පත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

## II වන කොටස

### මණ්ඩලයේ සංයුතිය

5. (1) ආයතනයේ කටයුතු පරිපාලනය, කළමනාකරණය හා පාලනය (මෙහි මින්-මතු "මණ්ඩලය" යනුවෙන් හඳුන්වනු ලබන) පාලන මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුතු ය. ආයතනයේ පරිපාලනය මණ්ඩලය වෙත පැවරී ඇති බව.

(2) ආයතනයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා, මණ්ඩලය විසින්, මේ පනතින් ආයතනය වෙත පවරා දී ඇති, වෙන් කර දී ඇති හෝ නියම කර ඇති බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය ඉටු කිරීම හා කාර්ය කිරීම කළ යුතු ය.

(3) තත් කාර්ය සඳහා සාදන ලද නියෝගවලට අනුකූලව වැඩ පිළිබඳ තුන් අවුරුදු සැලැස්මක් ද, වාර්ෂික සැලැස්ම සහ වැඩ පිළිවෙල ද වාර්ෂික අයවැය ලේඛනය ද පිළියෙල කර, ඒ සැලැස්ම හා වැඩ පිළිවෙල අමාත්‍යවරයාගේ අනුමතය සඳහා ඉදිරිපත් කිරීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

6. (1) මණ්ඩලය පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) නිල බලයෙන් සාමාජිකයන් වන තැනැත්තන්, එනම්-

(i) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු, වෘත්තීය පුහුණු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ;

(ii) මණ්ඩලයේ උප සභාපතිවරයා විය යුතු, කොමිෂන් සභාවේ සභාපතිවරයා ; සහ

(ආ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් පස් දෙනකු, ඒ සාමාජිකයන් අතුරින් තුන් දෙනකු පෞද්ගලික අංශයේ ව්‍යවසායකයන් අතුරෙන් පත් කරනු ලැබිය යුතු ය.

(2) පත් කළ සෑම සාමාජිකයකු ම, ඔහු ඉල්ලා අස්වීමෙන්, මියයාමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් තම ධුරය කලින් හිස් කරගතහොත් මිස, තමා පත් කරනු ලැබූ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(3) පත් කළ සාමාජිකයකු විසින්, අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඒ ඉල්ලා අස්වීම අමාත්‍යවරයා විසින් පිළිගනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

(4) රෝගාතුරවීම, අබලතාවට පත්වීම හෝ මාස තුනකට නොඅඩු කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට යම් පත් කළ සාමාජිකයකුට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් වැඩ බැලීම පිණිස අමාත්‍යවරයා විසින් වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(5) යම් පත් කළ සාමාජිකයකු ධුරයෙන් ඉවත් කිරීම යෝග්‍ය යයි අමාත්‍යවරයා කල්පනා කරන්නේ නම්, අමාත්‍යවරයා විසින් ඒ සඳහා හේතු කිසිවක් නොදන්වා ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඉන් අනතුරුව, ඒ සාමාජිකයා විසින් ස්වකීය ධුරය හිස් කර ඇතැයි සලකනු ලැබිය යුතු ය.

(6) (අ) පත් කළ සාමාජිකයකු මියයන හෝ ඉල්ලා අස්වන හෝ ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් 6(1)(ආ) වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන, ඒ මියගිය, ඉල්ලා අස් වූ හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ සාමාජිකයා වෙනුවට වෙනත් තැනැත්තකු සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(ආ) මේ උපවගන්තියේ (අ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, ඔහු කලින් ඉල්ලා අස්වුවහොත් හෝ මියයාමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ස්වකීය ධුරය හිස් කරතහොත් මිස, තමා අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(7) නිල බලයෙන් පත් වූ මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම, ඔහු මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ යම් තනතුරක් ප්‍රකාරව ද, ඒ තනතුර දරන තාක් කල්, ධුර දැරිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කිරීමට නුසුදුසුකම්.

7. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත් ;

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ සිහි විකල තැනැත්තකු බවට තීරණය කරනු ලැබ තිබේ නම් හෝ ප්‍රකාශයට පත් කරනු ලැබ තිබේ නම් ;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබ, නිදහස් නොකළ බුන්වත් හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකුව සිටී නම් ; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් විඳිමින් සිටී නම්, විඳ ඇත්නම්

ඒ තැනැත්තා, මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

මණ්ඩලයේ ලේකම්වරයා.

8. 16 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මණ්ඩලයේ ලේකම්වරයා විය යුතු ය. ඔහුට, මණ්ඩලයේ යම් රැස්වීමකට පැමිණ සිටීමට හිමිකම් තිබිය යුතු නමුත්, එහි දී ඡන්දය දීමට හිමිකම් නොතිබිය යුතු ය.

යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා දෝෂයක් තිබීමේ හේතුව නිසා මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත වන්නේ යයි සලකනු නොලැබිය යුතු බව.

9. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද, මණ්ඩලයට ක්‍රියා කළ හැකි අතර, මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක් මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.

10. අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා එසේ නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ අනුව, මණ්ඩලයේ සියලු ම සාමාජිකයන්ට හෝ එහි යම් සාමාජිකයකුට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ රැස්වීම්.

11. (1) සභාපතිවරයා හෝ ඔහු පැමිණ නොමැති විටක උප සභාපතිවරයා හෝ මණ්ඩලයේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය. සභාපතිවරයා හා උප සභාපතිවරයා යන දෙදෙනා ම පැමිණ නොමැති විටක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ රැස්වීම්, යටත් පිරිසෙයින් සෑම මාසයක ම එක් වරක් හෝ පවත්වනු ලැබිය යුතු අතර, මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා සණපූරණය සාමාජිකයන් තුන් දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණයකට එළඹිය යුතු සියලු ප්‍රශ්න, පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ලැබී ඇති ඡන්ද සංඛ්‍යාව සමාන

වන විටක, සභාපතිවරයාට හෝ ඒ රැස්වීමේ දී මූලාසනය දරන සාමාජිකයාට ස්වකීය ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(4) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කරගෙන යාම සම්බන්ධයෙන් එහි කාර්ය පරිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

අමාත්‍යවරයා විසින් දෙනු ලබන විධාන.

**12.** මේ පනත යටතේ මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින්, සාමාන්‍ය හෝ විශේෂ විධාන ලියවිල්ලකින් මණ්ඩලයට දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන බලාත්මක කරනු ලැබිය යුතු ය.

ආයතනයේ කටයුතු පිළිබඳව විමර්ශන කරන ලෙස නියම කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**13.** ආයතනයේ කටයුතු සියල්ල ම හෝ එහි යම් කටයුත්තක් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් මගින් විමර්ශනය කර වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි අතර, එවැනි යම් නියෝගයක් කරනු ලැබූ විට, ඒ නියමය බලාත්මක කිරීම පිණිස මණ්ඩලය මගින් ඒ තැනැත්තාට හෝ තැනැත්තන්ට අවශ්‍ය සියලු පහසුකම් සැලසීම සහ සියලු තොරතුරු සැපයීම, කළ යුතු ය.

ආයතනයේ මුද්‍රාව.

**14.** ආයතනයේ මුද්‍රාව—

(අ) මණ්ඩලය විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු හෝ තැනැත්තන් භාරයෙහි තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය ;

(ඇ) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා ම තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තබනු ලැබිය යුතු ය.

ශාස්ත්‍රීය කටයුතු කමිටුව.

15. (1) කාර්මික හා වෘත්තීය පුහුණුවේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳව හෝ ආයතනයේ වෙනත් යම් කටයුත්තක් පිළිබඳව නිර්දේශ කිරීම සඳහා මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකන (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු කමිටු යම් ප්‍රමාණයක් මණ්ඩලය විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(2) ආයතනයේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් අතුරෙන් සහ ඒ කමිටුව පිහිටුවනු ලැබූ ඒ ඒ කාර්මික හා වෘත්තීය පුහුණුවීම් ක්ෂෙත්‍රවල විශිෂ්ටත්වයක් දරන තැනැත්තන් අතුරෙන් මණ්ඩලය විසින් පත් කරනු ලබන සාමාජිකයන් තුන් දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් එක් එක් කමිටුව සමන්විත විය යුතු ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, යම් කමිටුවකට වෙන් කර දී ඇති කටයුතුවල විෂය පථය ඇතුළත ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් ඒ කමිටුව වගකිව යුතු ය.

(4) (3) වන උපවගන්තියෙන් එක් එක් කමිටුව වෙත පවරා ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, එක් එක් කමිටුව විසින් පහත දැක්වෙන බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හා කිරීම කළ යුතු ය :—

(අ) තත් කාර්ය සඳහා සාදන ලද රීතිවලට අනුකූලව ආයතනය මගින් නියම කරන ලද විභාග පැවැත්වීම සහ ඒ විභාගවලින් සාමාර්ථය ලැබ වෙනත් නියමිත කොන්දේසි සපුරා ආයතනයේ සහතික, අභිඥාන පත්‍ර, ආශ්‍රිත උපාධි හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කරනු ලැබීමට සුදුසුකම් ලබන තැනැත්තන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ආ) කාර්මික හා වෘත්තීය පුහුණුවට අදාළ කාරණා පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම ;

(ඇ) මණ්ඩලය විසින් කමිටුව වෙත යොමු කරන ලද යම් කාරණයක් පිළිබඳව සලකා බලා වාර්තා කිරීම ;

(ඈ) ආයතනය විසින් පවත්වනු ලබන හෝ පවත්වන ලද අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහනක් හෝ වැඩසටහන් සහ විභාග හා සම්බන්ධ කාරණා පිළිබඳව මණ්ඩලය වෙත නිර්දේශ කිරීම හා වාර්තා කිරීම ;

(ඉ) ආයතනය විසින් පවත්වනු ලබන හෝ පවත්වන ලද අධ්‍යයන පාඨමාලාවලට, ඉගැන්වීමේ වැඩසටහන්වලට සහ විභාගවලට කාර්මික හා වෘත්තීය පුහුණු කරවන්නන් ඇතුළත් කිරීමෙහි ලා නියම කළ යුතු අවශ්‍යතා මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඊ) ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලාවලට, ඉගැන්වීමේ වැඩසටහන්වලට සහ විභාගවලට අදාළව රීති සෑදීම සහ ඒ රීති අනුමතය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ;

(උ) ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග පරීක්ෂකයන් වශයෙන් පත් කරනු ලැබීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(ඌ) ශිෂ්‍යත්ව, පදක්කම් හා වෙනත් විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා වන කොන්දේසි මණ්ඩලය වෙත නිර්දේශ කිරීම ;

(එ) කමිටුවේ කර්තව්‍ය ඉටු කිරීමේ දී එයට සහාය වීම පිණිස, මණ්ඩලයේ අවසරය ඇතිව, කාරක සභා පත් කිරීම සහ කමිටුවක සාමාජිකයන් නොවන තැනැත්තන් එවැනි යම් කාරක සභාවක සාමාජිකයන් ලෙස පත් කිරීම.

## III වන කොටස

### ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය පත් කිරීම

ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කිරීම.

**16.** (1) අමාත්‍යවරයා විසින්, මණ්ඩලය විමසා, මණ්ඩලයේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාරිශ්‍රමික ඇතුළුව, සේවා නියුක්තිය පිළිබඳ නියම හා කොන්දේසි අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව ආයතනයේ කටයුතු මෙහෙයවීම ද, බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍ය ඉටු කිරීම හා කාර්ය කිරීම ද, ආයතනයේ නිලධරයන්ගේ හා සේවකයන්ගේ පරිපාලනය හා පාලනය ද අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පැවරෙන්නේ ය.

(3) මේ පනත යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා දී ඇති, නියම කර ඇති හෝ වෙන් කර දී ඇති යම් බලයක්, කර්තව්‍යයක් හෝ කාර්යයක් මණ්ඩලයේ යම් නිලධරයකුට හෝ සේවකයකුට පැවරීම අවශ්‍ය යයි අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකනු ලබන කවර හෝ විටක, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මණ්ඩලයේ අනුමතය ඇතිව එසේ කරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා හෝ සේවකයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව ඒ බලය, කර්තව්‍ය හෝ කාර්යය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කළ යුතු ය.

(4) අමාත්‍යවරයා විසින්, කිසිම හේතුවක් නොදක්වා (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා මියයාමෙන්, (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් හෝ අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඉල්ලා අස්වීමෙන්, අධ්‍යක්ෂ ජනරාල් ධුරය හිස් වන්නේ ය.

(6) (4) වන උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් පත් කරනු ලැබ ඇති යම් තැනැත්තකු, අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(7) අධ්‍යක්ෂ ජනරාල් ධුරයෙහි යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, (1) වන උපවගන්තිය යටතේ පත්වීමක් කරනු ලබන තෙක්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ධුරයේ කාර්ය ඉටු කිරීම සඳහා අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

ආයතනයේ කාර්ය මණ්ඩලය.

17. (1) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය ඉටු කිරීම පිණිස අවශ්‍ය යයි ආයතනය සලකන යම් නිලධරයන් හා සේවකයන් ආයතනය විසින් පත් කරනු ලැබිය යැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට, ආයතනය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා යම් අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ඒ නිලධරයන් හා සේවකයන් ආයතනය විසින් නිශ්චය කරනු ලබන සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(3) ආයතනයේ ඉල්ලීම පිට, රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ ද, රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ද කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(4) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ රජයේ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(5) ආයතනයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට හා ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) නිශ්චිත කාලයක් ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ඇති යම් තැනැත්තකු ආයතනය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් ආයතනයට සේවය කරනු ලබන යම් කාලයක්, ඒ ගිවිසුම යටතේ ඒ තැනැත්තාගේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරනු ලැබූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) ආයතනයේ ඉල්ලීම පිට, පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් සේවා නියුක්තයකු ඒ සාමාජිකයාගේ, සේවා නියුක්තයාගේ හා අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව, ආයතනය සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ ඒ

පළාත් පාලන ආයතනය විසින් එකඟවනු ලැබිය හැකි නියම හා කොන්දේසි මත, ඒ සාමාජිකයා හෝ සේවා නියුක්තයා ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(8) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ යම් පළාත් පාලන ආයතනයක යම් සේවා නියුක්තයකු (7) වන උපවගන්තිය යටතේ ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම ඒ සාමාජිකයා හා සේවා නියුක්තයා ද යටත් විය යුතු ය.

(9) ආයතනයේ ඉල්ලීම පිට, රාජ්‍ය සංස්ථාවක යම් සේවා නියුක්තයකු, ඒ සේවා නියුක්තයාගේ සහ ඒ සංස්ථාවේ පාලන මණ්ඩලයේ කැමැත්ත ඇතිව, එවැනි ම කැමැත්ත ඇතිව ආයතනය විසින් නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව, විශ්‍රාම වැටුප් හා අර්ථසාධක අරමුදල් පිළිබඳ නියම හා කොන්දේසි ද ඇතුළුව, ආයතනය හා ඒ සංස්ථාවේ පාලන මණ්ඩලය විසින් එකඟවනු ලැබිය හැකි නියම හා කොන්දේසි මත, ඒ සේවා නියුක්තයා ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(10) ආයතනයේ ඉල්ලීම පිට, 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනත යටතේ පිහිටුවන ලද යම් උසස් අධ්‍යාපන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු, ඒ නිලධරයාගේ හෝ සේවකයාගේ ද, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ ඒ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ ද කැමැත්ත ඇතිව, ආයතනය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා, ආයතනයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනි ම කැමැත්ත ඇතිව ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

ආයතනයේ නිලධරයන් හා සේවකයන් වෙත බලතල, කර්තව්‍ය හා කාර්ය පැවරීම.

18. ආයතනය විසින්, (මේ වගන්තියෙන් ආයතනය වෙත පැවරී ඇති බලය හැර) ආයතනයේ බලතල හෝ කර්තව්‍ය කිසිවක් ආයතනයේ යම් නිලධරයකු හෝ සේවකයකු වෙත පවරනු ලැබිය හැකි අතර, ඒ නිලධරයා හෝ සේවකයා විසින් එවැනි යම් බලයක්, කර්තව්‍යයක්, ආයතනයේ විශේෂ හෝ සාමාන්‍ය විධිවිධානයට යටත්ව, ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම, කළ යුතු ය.

## IV වන කොටස

### මුදල්

19. (1) ආයතනයට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ ම අරමුදලක් තිබිය යුතු ය. ආයතනයේ අරමුදල.

(2) ආයතනයේ අරමුදලට—

(අ) ආයතනයේ ප්‍රයෝජනය සඳහා කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල් ;

(ආ) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, කර්තව්‍ය ඉටු කිරීමේ දී හා කාර්ය කිරීමේ දී ආයතනයට ලැබෙන සියලු මුදල් ; සහ

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ආදායම, ගාස්තු, අයකිරීම්, ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ආයතනයට ලැබෙන සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

(3) ආයතනයේ අරමුදලින්—

(අ) මේ පනත යටතේ, ආයතනයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී ආයතනය විසින් දරන ලද වියදම් කිසිවක් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) මේ පනතින් හෝ මේ පනත යටතේ, අරමුදලින් ගෙවිය යුතු බවට නියම කර ඇති සියලු මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

20. මේ පනත යටතේ ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා ආයතනයට අවශ්‍ය විය හැකි මුදල් ආයතනය විසින්, අමාත්‍යවරයාගේ සහ මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, නැතහොත් එවැනි ම එකඟත්වය ඇතිව දෙනු ලැබූ යම් පොදු බලයක කොන්දේසිවලට අනුකූලව, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකින් ණයට ලබා ගත හැකි ය ; නැතහොත් සාකච්ඡා කොට ණය කොන්දේසි මත ලබා ගත හැකි ය : ආයතනය සතු ණයට ගැනීමේ බලතල.

එසේ වුව ද, මේ වගන්තිය යටතේ ආයතනය විසින් ණයට ගන්නා ලද යම් මුදලක් සම්බන්ධයෙන් ගෙවීම හිඟව ඇති මුළු මුදල, කිසිම අවස්ථාවක මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් මුදලක් නොඉක්මවිය යුතු ය.

ආයතනයේ මුදල් වර්ෂය.

21. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ආයතනයේ ගිණුම් විගණනය කිරීම.

22. රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, ආයතනයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## V වන කොටස

## පොදු විධිවිධාන

ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ කර්තව්‍ය, දේපළ, අරමුදල් හෝ බැදීම් පැවරීම.

23. (1) (මේ වගන්තියෙහි "ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය සතු වී, නියමිත දිනයට ඉහතින් වූ දිනයෙහි ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයේ කාර්ය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබූ සියලු නිශ්චල හා චංචල දේපළ නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි, ආයතනය වෙත පවරනු ලැබිය යුතු අතර, ඒ සියලු නිශ්චල හා චංචල දේපළ සියලු කාර්ය සඳහා ආයතනය වෙත සතු වී ඇතැයි සලකනු ලැබිය යුතු ය.

(2) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සඳහා ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය විසින් හෝ එය සමඟ ඇති කර ගෙන නියමිත දිනයට ඉහතින් වූ දිනයේ දී බලාත්මක වූ සියලු කොන්ත්‍රාත් හා ගිවිසුම් පවත්නා සහ කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව සම්බන්ධයෙන් ජාතික කාර්මික අධ්‍යාපන ආයතනය විසින් දරන ලද හා නියමිත දිනයට ඉහතින් වූ දිනයේ දී බලාත්මකව පවත්නා සියලු වගකීම්, නියමිත දිනයේ සිට ආයතනය විසින් හෝ එය සමඟ ඇති කර ගන්නා ලද කොන්ත්‍රාත් හා ගිවිසුම් ලෙස ද, දරන ලද වගකීම් ලෙස ද, සලකනු ලැබිය යුතු අතර ඒ අනුව ඒවා බලාත්මක කරනු ලැබිය හැකි ය.

(3) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ජාතික කාර්මික අධ්‍යාපන ආයතනයෙන්, ආයතනය වෙත කර්තව්‍ය පැවරීම පහසු කිරීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින්, යම් ලිඛිත නීතියක් හා අනනුකූල නොවන යම් අන්තර්කාලීන නියෝග සාදනු ලැබිය හැකි අතර, ඒ නියෝග නියමිත දිනයේ සිට අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් සඳහා බලපැවැත්විය යුතු ය.

රජයේ ඉඩම් ආයතනය වෙත සතු කිරීමට අමාත්‍යවරයා සතු බලය.

**24.** (1) රජයේ ඉඩම් ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා යම් රජයේ ඉඩමක් ආයතනයට අවශ්‍ය බව අමාත්‍යවරයා සලකන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, (මෙහි මින් මතු "සතු කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයේ නිශ්චිතව සඳහන් යම් සීමා කිරීම් හෝ කොන්දේසි ඇත්නම් ඒ සීමාකිරීම් හෝ කොන්දේසිවලට යටත්ව, ඒ නියමයේ නිශ්චිතව සඳහන් යම් දිනයක සිට බලපැවැත්වෙන පරිදි ඒ ඉඩම ආයතනය වෙත සතු කරනු ලැබිය හැකි ය.

(2) සතු කිරීමේ නියමයක, ඒ සතු කිරීමේ නියමයේ නිශ්චිතව සඳහන් යම් සීමා කිරීම් හා කොන්දේසිවලට යටත්ව, ඒ සතු කිරීමේ නියමයේ නිශ්චිතව සඳහන් යම් ඉඩමක පරම අයිතිය සියලු බැඳීම් වලින් තොරව ආයතනය වෙත ලබාදීමේ බලය තිබිය යුතු ය.

ආයතනය සඳහා යම් ඉඩමක් හෝ යම් ඉඩමක සම්බන්ධතාවක් අනිවාර්යයෙන් අත්කර ගැනීම.

**25.** ආයතනයේ යම් කාර්යයක් සඳහා රජයේ ඉඩමක් නොවන යම් ඉඩමක් හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් හෝ සම්බන්ධයෙන් වූ යෝජිත අත්කර ගැනීම, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය හැකි ය. එවැනි නියමයක් එසේ පළ කරනු ලැබූ අවස්ථාවක, ඒ නියමයෙහි නිශ්චිත සඳහන් ඉඩම හෝ යම් ඉඩමක යම් සම්බන්ධතාවක් හෝ පොදු කාර්යයන් සඳහා අවශ්‍ය වන්නේ යයි සලකනු ලැබ, ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගනු ලැබිය හැකි ය. තවද ඒ ඉඩම හෝ ඒ සම්බන්ධතාව එසේ අත්කර ගනු ලැබූ විට, ආයතනය වෙත පවරා දෙනු ලැබිය යුතු ය ; තවද, ඒ අනුව ඒ දේපළ ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන ඒ පනත යටතේ ආයතනය වෙත පවරනු ලැබිය හැකි ය.

මණ්ඩලය විසින් එහි කටයුතු පිළිබඳව වාර්තාවක් අමාත්‍යවරයා වෙත සැපයිය යුතු බව.

**26.** ආයතනයේ එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු මාස හයක කාලයක් ඉකුත් වීමට පෙර, මණ්ඩලය විසින්, ඒ වර්ෂය තුළ ආයතනයේ කටයුතු පිළිබඳව සම්පූර්ණ විස්තරයක් ඇතුළත් වාර්තාවක් අමාත්‍යවරයා වෙත සැපයිය යුතු අතර, අමාත්‍යවරයා විසින් ඒ වාර්තාවේ පිටපත් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සැලැස්විය යුතු ය.

ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු බව.

**27.** ආයතනය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සාමාජිකයන් හා ආයතනයේ නිලධරයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

**28.** මණ්ඩලයේ සියලු සාමාජිකයන් හා ආයතනයේ සියලු නිලධරයන් හා සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**29.** (1) (අ) ආයතනය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ආයතනයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ ආයතනයේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට, නිලධරයාට, සේවකයාට හෝ අනුයෝජිතයාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

(2) යම් අධිකරණයක් ඉදිරියෙහි ආයතනය විසින් හෝ ආයතනයට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනය විසින් දරන ලද යම් වියදමක්, ආයතනයේ අරමුදලින්

ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ආයතනයට ගෙවන ලද හෝ ආයතනය විසින් අයකර ගන්නා ලද නඩු ගාස්තු කිසිවක්, ආයතනයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කර ලද හෝ කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියෙහි ඔහුට විරුද්ධව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද වියදම් කිසිවක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලදැයි අධිකරණය තීරණය කරන්නේ නම්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අයකර ගනු ලැබුවේ නම් මිස, ආයතනයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

නියෝග.

**30.** (1) නියෝග සෑදීමට මේ පනතින් නියමිත හෝ බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට එය බලාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් එය යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**31.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**32.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"පළාත් පාලන ආයතනය" යන්නෙන්, යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, ඒ යම් සභාවක් විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම්කිසි නීතියකින් හෝ නීතියක් යටතේ හෝ ඇතිකොට පිහිටුවන ලද කවර වූ හෝ අධිකාරියක් ඊට ඇතුළත් වේ ;

"පළාත් සභාව" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIIඅ පරිච්ඡේදය මගින් පිහිටුවන ලද පළාත් සභාවක් අදහස් වේ ;

"විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ.